## **2018.04.24** වන දින පෙ.ව. **10.00**ට පමණ සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී පවත්වන ලද කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

**සහභාගී වූ :**

1. ගරු කාරක සභා සභාපති - ලියනගේ චන්දන කුමාර මැතිතුමා
2. ගරු කාරක සභික - එල්.නන්දකුමාරසිංහ මැතිතුමා
3. ගරු කාරක සභික - පී.කේ. උපුල් ජිනේන්ද්‍රකුලතිලක මැතිතුමා
4. ගරු කාරක සභික - එච්. වරුණදිලිප්කුමාර මැතිතුමා
5. ගරු කාරක සභික - එච්.පී.උපුල්ප්‍රසන්න මැතිතුමා
6. ගරු කාරක සභික - කේ.නිමල් යසසිරිකළුපහන මැතිතුමා
7. ගරු කාරක සභික - ඩබ්. අසෝක වැලිකල මැතිතුමා
8. ගරු කාරක සභික - ජී.කුමුදිණීජයවර්ධන මැතිතුමිය
9. ගරු කාරක සභික - එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය
10. ගරු කාරක සභික - එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය

**සහභාගී නොවූ :**

1. ගරු කාරක සභික - සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා

**සහභාගී වූ නිලධාරීන් :**

1. ලේකම් - කේ.ඒ. චන්දන පද්මසිරි මහතා
2. ප්‍රධාන කළමනාකරණ සහකාර - කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය
3. සංවර්ධන සහකාර - ඊ.ඒ.ඩී.කේ. එදිරිසිංහ මිය
4. කාර්යභාර නිලධාරී - කොස්ගම - රේණුකා ඉද්දමල්ගොඩ මිය
5. කාර්යභාර නිලධාරී - පාදුක්ක - ඩී.සී.ජේ. අමරසිංහ මිය
6. කාර්යභාර නිලධාරී - කහහේන - ජී. චමරි පත්මලතා මිය
7. සංවර්ධන නිලධාරී - ඉෂානි කමලිකා මිය
8. තාක්ෂණ නිලධාරී - පාදුක්ක - එන්.පී. දිවිගල්පිටිය මිය
9. තාක්ෂණ නිලධාරී - කොස්ගම - එච්.යූ. නිශාන්ති මිය
10. තාක්ෂණ නිලධාරී - හංවැල්ල - එල්. ඒ. ධර්මසේන මයා
11. කළමනාකරණ සහකාර - එන්.යූ. කුමාර මයා

කාරක සභාවට පැමිණි සියලුදෙනා සාදරයෙන් පිළිගත් ගරු සභාපතිතුමා කාරක සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

## 01. ලිපි ලේඛණ සලකා බැලීම.

1. අනුර දේපල සමාගම විසින් ලබාදී ඇති ඉඩම් කොටස දල බෑවුමක් නිසා එහි ක්‍රීඩා පිටියක් ඉදිකළ නොහැකි බව සඳහන් කරමින්, ''වේරගොල්ලට ක්‍රීඩා පිටියක් ලබාගැනීම." යන හිසින් යුතුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් 2018.04.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, අදාල ඉඩම සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

2. ''ආනන්දගම පොදු සුසාන භූමියේ දැල්වැට ඉදිකිරීම" යන හිසින් යුතුව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

3. දිද්දෙණිය දකුණ 439/ඒ ග්‍රාම සේවා වසමට අයත් සම්බුධිවත්තට ඇතුළුවන මාර්ගය තනි පුද්ගලයෙකු විසින් අවහිර කිරීමට අදාලව ''439/ඒ - දිද්දෙණිය දකුණසම්බුධිවත්ත මාර්ගය අවහිර කිරීම හා නව මාර්ගයක් ඉදිකිරීම අත්හිටුවා ගැනීම" යන හිසින් යුතුව 2017.10.05 දිනැතිව ප්‍රදේශවාසීන් 19 දෙනෙකුගේ අත්සනින් යුත් ලේඛනයක් සමඟ යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

4. VC නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකර ඇති දැල් වැට හා පැති බැම්ම හේතුවෙන් ආබාධිත පුද්ගලයන් හට සේවා පියසට ඇතුළුවීමට ඇති අපහසුතාවය දන්වා ''සාලාව සේවා පියසෙහි ඇති පැති බැම්ම ඉවත්කිරීම" යන හිසින් යුතුව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

5. සීවලී වත්ත කුසුම් නිවාස යෝජනා ක්‍රමයෙහි පාර දෙපස කාණු පද්ධතිය අවහිර වීමට අදාලව ''අනවසර ගොඩ කිරීමක් සම්බන්ධව" යන හිසින් යුතුව 2018.04.22 දිනැතිව හංවැල්ල, පහල හංවැල්ල, සීවලී නිවාස, අංක 128/8/8 ලිපිනයෙහි පදිංචි බී.කේ. නිශාන්ත රත්නසිරි මයා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

6. ජයවිරගොඩ ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන අතුරු මාර්ගය ''ජයවීරගොඩ නා සෙවන පාර" වශයෙන් ප්‍රසිද්ධව ඇති බැවින් ''අතුරු පාරක් සඳහා නමක් ප්‍රසිද්ධ කිරීම" යන හිසින් යුතුව 2018.04.08 දිනැතිව හංවැල්ල, ජයවීරගොඩ, අංක 73ඒ ලිපිනයෙහි පදිංචි එච්. කිර්තිරත්න සිරිවර්ධන මයා විසින් ප්‍රදේශවාසීන් 37 දෙනෙකුගෙන් යුත් අත්සන් ලේඛනයක් සමඟ යොමු කරන

ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

7. පාදුක්ක, බෝපේ, ගුරුලාන, අංක 183 හි පදිංචි ඇම්. සෝමදාස මහතා විසින් ඔහුට අයත් අංක 201/1, හයිලෙවල් පාර, ගලගෙදර පිහිටි කහටගහවත්ත නැමති ඉඩමට පින්නවල පදිංචි පී. සිරිසේන යන අයට අයත් ඉඩමෙන් වතුර පිටකිරීම සඳහා තාප්පයෙන් තබා ඇති බට හා කවුලු ඉවත් කරදෙන ලෙස ඉල්ලමින් 2018.04.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

8. ''වේරගොල්ල කනත්ත පිරිසිදු කිරීම පිළිබඳව'' යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, පසුගිය කාලය තුළ ලේකම්තුමා විසින් සුසාන භූමි සුද්ධ කිරීමේ වැඩසටහන ඉතාමත් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කළ අතර නැවතත් එම වැඩසටහන ඒ ආකාරයෙන්ම ආරම්භ කිරීම වඩා කාලෝචිත බවත් ඒ තුළින් බල ප්‍රදේශයේ සුසාන භූමි ඉරිදා දිනවල සභා සේවකයන් හා ගම් වැසියන්ගේ සහභාගීත්වයෙන් ඉදිරියේදීත් එලෙසින්ම ක්‍රියාත්මක කිරීමටත් එහිදී මෙම ඉල්ලීම ඉටු කිරීමටත් තීරණය කරන ලදි.

9. ''වේරගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම.'' යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මෙම මාර්ගය නැවත සකස් කිරීම සඳහා රුපියල් ලක්ෂ 19 ක් පමණ වැයවන බව තාක්ෂණ නිලධාරී කාරක සභාවට පැහැදිලි කළ අතර ප්‍රදේශවාසීන් විසින් යෝජනා කර ඇති පරිදි තාවකාලිකවවැලි කොට්ට දමා මාර්ගය සකස් කිරීමට සීතාවක ප්‍රාදේශීය සභාවේ සහාය ද ලබාදීම සුදුසු බවට හා මාර්ගයය සිදුවූ අලාභ හානිය අය කිරීමට නීත්‍යානුකූල පියවර ගන්නා ලෙස තාක්ෂණ නිලධාරීට හා වැඩ අධිකාරීට දැන්වීමට තීරණය කරන ලදි.

10. රංවල පහන ලඟින් පුවක්පිටිය දකුණ කනිෂ්ඨ විද්‍යාලය අසලින් පටන් ගන්නා ගල්කන්ද පාර මීටර් 75 ක් දුරට සංවර්ධනය කළ යුතු බව දන්වා ''ගල්කන්ද පාර ප්‍රතිසංස්කරණය කිරීම.'' යන හිසින් යුතුව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

11. ''සුද්ද පවිත්‍ර කරගැනිම හා ආදර්ශ සුසාන භූමියක් සම්බන්ධවයි.'' යන හිසින් යුතුව 2017.07.15 දිනැතිව ලේකම් ග්‍රාම සංවර්ධන සමිතිය වග - බටහිර විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඉදිරියේදී නැවත ක්‍රියාත්මක කිරීමට යෝජිත සුසාන භූමි සුද්ධ කිරීමේ ඉරිදා දින වැඩසටහනට මෙම සුසාන භූමිය ද ඇතුලත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.

12. දිද්දෙණිය උතුර බංඩාරවත්ත ප්‍රජාශාලාව පිහිටා ඇති ඉඩම ප්‍රාදේශීය සභාව සතු ඉඩමක්ද යන්න සොයා බලා එම භූමියේ ඇති ඉතිරි බිම් කොටසෙහි මාතෘ සායනයක් සාදා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් 2018.04.24 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

13. පිටුම්පේ සෝමානන්ද මාවතේ සිට වවුල් කැලේ හා මුස්ලිම් ගම්මානයට හැරෙන තුංමන් හංදියට මායිම්ව පිහිටා ඇති ''Plan No: 895පෙන්නුම් කරන කානුව සම්බන්ධව" යන හිසින් යුතුව 2018.04.20 දිනැතිව එච්. එච්. නිශාන්ත නන්දන මයා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, ඉල්ලීම පරිදි කාණුව සකස් කිරීම සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

14. හොරණ - පාදුක්කප්‍රධාන මාර්ගයේ සිට ගලා එන වැසි ජලය නිසි පරිදි බැසයාමට කොන්ක්‍රීට් යොදා කාණුවක් සකස් කරදෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල විතානගේ මැතිතුමා විසින් 2018.04.22 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරනලදි.

15. උඩුමුල්ල කොට්ඨාශයේ යටවතුර ගමේ පිහිටි සුදුවැලිකැටිය මාර්ගයේ දැනට කොන්ක්‍රීට් අතුරා ඇති කොටසට අමතරව ඉතිරි කොටස ද කොන්ක්‍රීට් අතුරා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල විතානගේ මැතිතුමා විසින් 2018.04.22 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන්තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

16. උඩුමුල්ල කොට්ඨාශයේ කහවල ගමෙහි පිහිටි රණවිරු සුජිත් ප්‍රියන්ත මාවතේ කොටසක් කොන්ක්‍රීට් යොදා සකසා ඇති අතර එම මාර්ගයේ මැද කොටස කොන්ක්‍රීට් හෝ තාර අතුරා සංවර්ධනය කරදෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල විතානගේ මැතිතුමා විසින් 2018.04.22 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, සංවර්ධනය කළ යුතු කොටස සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

17. වේරගොල්ල උතුර ප්‍රධාන මාර්ගය සහ මහවෙදගේ බෙහෙත් ශාලාව අසලින් ඇති මීපලාව මාර්ගය ප්‍රිමික්ස් යොදා සංවර්ධන කරදෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ පී. දිවිගල්ල මැතිතුමා විසින් 2018.04.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

18. ''පාරක් කොන්ක්‍රීට් කිරීම සඳහා" යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් දිද්දෙණිය දකුණ ග්‍රාමසේවා වසමේ තැන්නපිට හේන පාරට මීටර් 300 ක් පමණ මාර්ගය සහ දිද්දෙණිය බංඩාරවත්ත කරුණාපාල මහතාගේ කඩය අසලින්

ඇති හරස් මීටර් 150 ක් පමණ මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් අතුරා පිළිසකර කර දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

19. අරුක්වත්ත, වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ ඉඩම් වලට අයත් ජලය බැස යන ප්‍රධාන ජල කාණුව අවහිර කිරීම සම්බන්ධවපාදුක්ක, අරුක්වත්ත උතුර, අරලිය මාවත පදිංචි ප්‍රදේශවාසීන් 9 දෙනෙකුගේ අත්සනින් යුක්තව 2018.04.23 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් යොමුකරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, අදාල අවහිරතාව සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

20. ''පාරක් කොන්ක්‍රීට් කර ගැනීම සඳහා'' යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් 443 සී ඉහල හංවැල්ල දකුණ ග්‍රාමසේවා වසමේ බදුවත්ත ගල්මුල්ල පාරෙන්, ලුවිස් කන්දට යන පාර මීටර් 150 ක් පමණ දුරට කොන්ක්‍රීට් අතුරා දෙන ලෙස යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

21. ''පාරක් ප්‍රතිසංස්කරණය කරගැනීම සඳහා'' යන හිසින් යුතුව 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ජී. ස්වර්ණලතා මැතිතුමිය විසින් නිරිපොල ගල්කැටිය කන්ද පාර කිලෝමීටර් එකක් පමණ මාර්ගය ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

22. අරුක්වත්ත, අමරසිංහ මාවත ප්‍රධාන මාර්ගයේ පිවිසුම් ස්ථානයේ සිට මීටර් 300 ක් පමණ දුර තාර හෝ කොන්ක්‍රීට් දමා දෙන ලෙස ඉල්ලමින් 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා විසින් කරදෙන ලෙස යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

23. බොල්ලතාව ග්‍රාම සේවාවසමේ බොල්ලතාව, වඩු මඩුව මාර්ගය සම්පූර්ණයෙන්ම තාර ගැලවී විනාස වී ඇති බැවින් එම පාර අළුතින් නිමකර දෙන ලෙස 2018.04.20 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

24. වෙරගල ඩේල්වත්ත පිවිසුම් මාර්ගයේ දැඩි ලෙස සෝදා පාලුවට ගොස් ඇති මීටර් 150 ක පමණ කොටස තාර යොදා සංවර්ධනය කරදෙන ලෙස සහ මාහිංගල කැටකැල්ල පාරේ අබලන් වූ බෝක්කුව අළුත්වැඩියා කරදෙන ලෙස ඉල්ලමින්2018.04.22 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

චින්තක දේවින්ද සමරවීර මැතිතුමා විසින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

25. ''මාර්ග කොන්ක්‍රීට් කර ගැනීම සඳහා " යන හිසින් යුතුව 2018.03.20 දිනැතිව වග - ඉරිදාපොල, ජන උදාන ගම්මානය, අංක 61/25 පදිංචි එන්.එම්. සරත් මංජුල මයා විසින් අයර්වත්ත ජන උදාන ගම්මානයේ ජල ටැංකියට යන මාර්ගය උඩට යන මාර්ගයේ මීටර් 70 ක් පමණ කොටස මිනුම් කටයුතු සිදුකොට මාර්ගය පුළුල් කර කොන්ක්‍රීට් කරදෙන ලෙස හා උණ පඳුර ලඟ කඩේ සිට උඩ පාර ද අළුත්වැඩියා කරදෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මෙම මාර්ග සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී වාර්තාවක් හා දල ඇස්තමේන්තුවක් ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

26. ''ගල්දොල පාර අතුරු මාර්ගය ජනසවි මාවත අවහිර කිරීම" යන හිසින් යුතුව 2018.02.28 දිනැතිව කලුඅග්ගල - වග, අංක 309/සී හි පදිංචි එච්.පී. සරත් විමලවීර මයා විසින් අංක 436/ඒ සුදුවැල්ල ග්‍රාම නිලධාරී වසමේ ගල්දොල පාර අතුරු මාර්ගය වන ජනසවි මාර්ගය අවහිර කරමින් කර ඇති සියලු බාධාවන් ඉවත් කරදෙන ඉල්ලමින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

27. ''මාර්ග පද්ධතියට අදාල කාණු පද්ධතිය පිළිසකර කරගැනීම සම්බන්ධවයි" යන හිසින් යුතුව 2018.04.22 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් උග්ගල්ල, කොට්ඨාශයට අයත් අංගම්පිටිය, හල්පේ, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවල කාණු පද්ධතිය අවහිරව ඇති බැවින් කාණු පද්ධතිය ජලය බැස යන පරිදි සකස් කිරීම, තාර හෝ කොන්ක්‍රීට් අළුතින් යොදන්නේ නම් කාණු පද්ධතිය පිළිසකර කිරීම පිළිබඳව දැඩි අවධානය යොමු කරන ලෙසත් සහ ජල ව්‍යාපෘතිය මඟින් සිදුකළ කාර්යයන් නැවත පිළිසකර කිරීමේ නිසි පරිදි නැවත පිළිසකර නොවූ තැන් පිළිබඳව අවධානය යොමුකරන ලෙසත් යෝජනා කරමින් යොමු කරන ලද ලිපිය සලකා බැලූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබාගැනීමට තීරණය කරන ලදි.

28. 2018.04.24 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් මැතිතුමා විසින් යොමු කරන ලද ලිපි සලකා බැලූ කාරක සභාව, ඒ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරී වාර්තා හා දල ඇස්තමේන්තු ලබාගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

i. මුරුතගම නාගරුක්ඛාරාම මාර්ගයේ ඉතිරි කොටස තාර යොදා අළුත්වැඩියා කිරීම.
ii. පහල කොස්ගම බටහිර වසමේ සංස්කෘතික මධ්‍යස්ථානය අසල සිට ඇති මාර්ගය පිළිසකර කරගැනීම.
iii. රණවිරුගම අංක 01 නිවස ඉදිරිපිට වතුර බසින ප්‍රධාන කාණුව කොන්ක්‍රීට් කිරීම හා රණවිරු ගම්මානයට ඇතුළුවීමට ඇති ප්‍රධාන මාර්ගය තාර දමා කාණු පද්ධතිය සකස් කිරීම.
iv. සාලාව VC නිවාස වලට යන ප්‍රධාන මාර්ගයේ බුදු මැදුර අසල ඇති මාර්ගය අළුත්වැඩියා කිරීම.
v. ආනන්දගම ගම්මානයේ සිට වතුර බසින ප්‍රධාන කාණු පද්ධතියක් ඉදිකිරීම.

vi. බොරළුගොඩලන්දේ බුදු පිළිමය අසල සිට පොදු නාන ළිඳ අසල ඇති ප්‍රධාන මාර්ගය දෙපසට කාණු පද්ධතියක් දමා එම මාර්ගය අළුත්වැඩියා කිරීම.

vii. දාතුරුගොඩ ත්‍රීවිල් වැඩපල අසල සිට පහලට ඇති මාර්ගය පිළිසකර කිරීම.

## 02. <u>සාකච්ඡා සටහන්</u>

1. ප්‍රාදේශීය සභාව සතු මාර්ග පිළිසකර කිරීමට ව්‍යාපෘති වාර්තාවක් සකස් කර සභා අනුමැතියට ඉදිරිපත් කර ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්තුමිය (බ.ප.) වෙතින් අනුමැතිය ලබාගැනීම සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට සංවර්ධන සහකාර වෙත පවරන ලදි.

2. සභාව සතුව පවතින මාර්ග තලන ඉතා අබලන් තත්වයේ පවතින බැවින් සඳහා ටොන් 8-10 මාර්ග තලන රෝල් එකක් හා ටොන් 2 – 3 මාර්ග තලන වයිබ්‍රේටි රෝල් දෙකක් සීතාවක ප්‍රාදේශීය සභාව වෙත ලබාදෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමියගෙන් ඉල්ලා සිටීමට තීරණය කරන ලදි.

3. සීතාවක ප්‍රාදේශීය සභාව සතු මාර්ගවල ජල නල එලීමේදී සභාව සතු මාර්ගවලට සිදුකරන ලද අලාභ හානි යථා තත්වයට පත් නොකිරීම සම්බන්ධව ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ව්‍යාපෘති භාර නිලධාරීන් හා ICC, MAGA, SIERRA, ACCESS යන ආයතනවල නිලධාරීන් ඉදිරි කාරක සභාව වෙත කැඳවා සාකච්ඡා කිරීමට තීරණය කරන ලදි.

4. ප්‍රාදේශීය සභාව සතු පාර දෙපස අවහිර වන සේ මල්පැල සිටුවීම සිදුවන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද කාරක සභාව ප්‍රාදේශීය සභාව සතු පාර දෙපස මල් පැල සිටුවීමට කිසිඳු අවසරයක් ලබාදී නොමැති බවත් පවසන ලදි.

5. මලගල ප්‍රජා ශාලාව සඳහා විදුලිය ලබාදීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා කරන ලද විමසීමේදී අදාල ඉඩම ප්‍රාදේශීය සභාව සතු දේපලක් නොවන බැවින් සහා අරමුදල් ඒ සඳහා යෙදවිය නොහැකි බව ගරු ලේකම්තුමා විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදි. ඒ අනුව එම භූමිය මැනුම් කර ඒ සඳහා ප්‍රකාශන ඔප්පුවක් සකස් කිරීම සුදුසු බවත් ඒ සඳහා අවශ්‍ය පිඹුරු පත ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා සකස් කර ලබාදෙන බවත් දන්වා සිටින ලදි.

**<u>අද දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීමේදී ගන්නා ලද ඉහත සඳහන් තීරණ ඇතුලත් කාර්මික සේවා කාරක සභා වාර්තාවට එකඟ වෙමින් පහත අත්සන් තබමි.</u>**

1. ගරු කාරක සභා සභාපති - ලියනගේ චන්දන කුමාර මැතිතුමා

   ..........................................................................

2. ගරු කාරක සභික - එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා

   ..........................................................................

3. ගරු කාරක සභික - පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා

   ..........................................................................

4. ගරු කාරක සභික - එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා

   ..........................................................................

5. ගරු කාරක සභික - එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා

   ..........................................................................

6. ගරු කාරක සභික - කේ.නිමල් යසසිරි කළුපහන මැතිතුමා

   ..........................................................................

7. ගරු කාරක සභික - ඩබ්. අසෝක වැලිකල මැතිතුමා

   ..........................................................................

8. ගරු කාරක සභික - ජී.කුමුදිණී ජයවර්ධන මැතිතුමිය

   ..........................................................................

9. ගරු කාරක සභික - එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය

   ..........................................................................

10. ගරු කාරක සභික - එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය

    ..........................................................................

කාරක සභාවේ වැඩ කටයුතු ප.ව. 13.20ට පමණ නිමාවට පත්විය.

2018.04.24 වන දින
සීතාවක ප්‍රාදේශීය සභා කමිටු ශාලාවේදී.